# රටේ අවශ්‍යතා සපිරෙන අධ්‍යාපන ක්‍රමයක් තවමත් නෑ

## මිලින්ද මොරගොඩ කියයි

(රන්ජිත් ආනන්ද ජයසිංහ)

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය අදට ගැලපෙන අයුරින් ප්‍රායෝගික තත්ත්වයට පත් කළ යුතු යයි කොළඹ දිස්ත්‍රික් එජාප පාර්ලිමේන්තු මන්ත්‍රී මිලින්ද මොරගොඩ මහතා පැවසීය.



කොළඹ දිස්ත්‍රික් එජාප මන්ත්‍රී මිලින්ද මොරගොඩ මහතා එහිදී දේශනයක් පැවැත්වූ අවස්ථාව දකුණේ ඡායාරූපයෙන් දැක්වෙන අතර උත්සවයට සහභාගි වූවන්ගෙන් පිරිසක් වමේ ඡායාරූපයෙන් දැක්වේ.

මොරගොඩ මහතා මෙසේ කීවේ මොහාන් ලාල් ග්‍රේරු පදනම මගින් සංවිධානය කළ වෘත්තිය පුහුණු පාඨමාලා හැදෑරූ සිසු සිසුවියන් 400කට සහතික ප්‍රදානය සඳහා නුගේගොඩ ලයිසියම් ශාලාවේ පැවැති උත්සවය අමතමිනි.

අද පවත්නා අධ්‍යාපන ක්‍රමය අධිරාජ්‍යවාදීන් විසින් නිර්මාණය කරනු ලැබුවේ රටේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන නොව, ඔවුන්ගේ අවශ්‍යතා ගැන අවධානය යොමු කරමින් යැයි කීය. එහෙත් ඉන්දියාව, සිංගප්පූරුව සහ මලයාසියාව වැනි රටවල අධ්‍යාපන ක්‍රම සකස් කරගත්තේ ඒ රටවල ජාතික අවශ්‍යතා ගැන පුළුල් අධ්‍යයනයකින් පසුව යැයි මොරගොඩ මහතා පැවසීය.

නිදහස ලබා වසර 50ක් ගතවීමෙන් පසුවත් ශ්‍රී ලංකාවේ මේ තත්ත්වය නොවෙනස්ව පවතින බවද මෙයට රටේ පැවති දේශපාලන නායකත්වයද වගකිවයුතු බවද මොරගොඩ මහතා සඳහන් කළේය. අද මෙරට අධ්‍යාපනයේ අවසන් අරමුණ රජයේ සේවයට ලිපිකරුවන් බිහිකිරීම පමණකැයි ඒ මහතා සඳහන් කළේය.

මේ තත්ත්වය නිසා අධ්‍යාපනය ගැන මෙන්ම දේශපාලනය ගැනද ජනතාව තුළ තිබූ විශ්වාසය පළුදු වී ඇති බව කී මොරගොඩ මහතා, ඉන්දියාවේ ජනගහනයෙන් සෑම දස ලක්ෂයකටම සිටින්නේ එක් ඇමැතිවරයකු බැගින් වුවද ශ්‍රී ලංකාවේ ජනගහණයෙන් සෑම ලක්ෂයකටම එක ඇමැතිවරයකු බැගින් සිටින බවද කීය.

මේ තත්ත්වය පිළිබඳව සමාලෝචනයක් කළ යුතුව ඇතැයි කී මොරගොඩ මහතා ශ්‍රී ලංකාවට දැන් ගැලපෙන්නේ කුඩා අමාත්‍ය මණ්ඩලයක් බවද මෙබඳු කුඩා අමාත්‍ය මණ්ඩලයක් පත් කොට ඔවුන් වැරදි ආකාරයට කටයුතු කරන්නේ නම් ඔවුන්ට දඬුවම් කරන ක්‍රමයක් ඇති කිරීම ගැනත් අවධානය යොමු කළ යුතු බවද පැවසීය.

මෙම උත්සවය අමතා මොහාන් ලාල් ග්‍රේරු මහතාද කතා කළේය.

මොහාන් ලාල් ග්‍රේරු පදනමෙන් සංවිධානය කළ වෘත්තිය පුහුණු පාඨමාලා හැදෑරූ 400කට සහතික පත්‍ර ප්‍රදානය කිරීම සඳහා පසුගියදා නුගේගොඩ ලයිසියම් ශාලාවේදී උත්සවයක් පවත්වන ලදී.